" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / பொது இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.06.14 |
|---|---|---|---|---|---|

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පාලන චක්‍රලේඛ අංක 01/2022**

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**<u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකදී අනුගමනය කලයුතු ක්‍රියා පිළිවෙල</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 හා 01/2019 (1) අනුව මෙම පාලන චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ශීර්ෂයන් ලෙස ජ්‍යෙෂ්ඨතාවය ඇතුලත් කර ඇති අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබා දීමට පහත සඳහන් පරිදි කටයුතු කලයුතු බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව එකඟතාවය පළ කර ඇත.

03. අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලයට අමතරව වන සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබා දිය යුතු අතර එම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දීමේදී වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දීමද සිදුකල යුතුය.

උදා : බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවල ජ්‍යෙෂ්ඨතාවයට 60ක් හා කුසලතාවයට 40ක් ලෙස ලකුණු වෙන්කර ඇති අවස්ථාවලදී, වැඩිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සේවය කර ඇති නිලධාරියාට මුළු ලකුණු 60 ලබාදිය යුතුය.

එම නිලධාරියාගේ මුළු සේවා කාලය වසර 05ක් වන්නේ නම්,
එක් වසරකට ලකුණු 12
මාස 06කට ලකුණු 06
මාස 03කට ලකුණු 03
ලෙස සෙසු නිලධාරීන්ට ලකුණු ලබා දෙනු ලැබේ.

03. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අවසන් පුරප්පාඩු කිහිපය සඳහා සමාන ලකුණු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව පුරප්පාඩු ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථාවකදී සමාන ලකුණු ලැබූ නිලධාරීන්ගේ එවකට පවත්නා ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව සළකා උසස්වීම් ප්‍රදානය කරනු ලැබිය යුතුය.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/04-01-30/02/2018

ඔබේ අංකය
உமது இல.
Your No.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

දිනය
திகதி
Date
2019 ජුනි මස 13 දින

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබාදෙනු ලබන යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකදී අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙල.</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ශීර්ෂයන් ලෙස ජ්‍යෙෂ්ඨතාවය ඇතුළත් කර ඇති අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබාදීමට පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය අවම සේවා කාලයට අමතරව වන සේවා කාලය සඳහා පමණක් ලකුණු ලබාදිය යුතු අතර එම අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දීමේදී වැඩිම අමතර සේවා කාලයක් සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන්කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබාදීමද සිදුකළ යුතුය.

උදා: බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථාවල ජ්‍යෙෂ්ඨතාවයට 60 ක් හා කුසලතාවයට 40ක් ලෙස ලකුණු වෙන් කර ඇති අවස්ථාවලදී, වැඩිම අමතර සේවා කාලයක් සේවය කර ඇති නිලධාරියාට මුළු ලකුණු 60 ලබාදිය යුතුය.

එම නිලධාරියාගේ මුළු සේවා කාලය වසර 05ක් වන්නේ නම්,
එක් වසරකට ලකුණු 12
මාස 06කට ලකුණු 06
මාස 03කට ලකුණු 03
ලෙස සෙසු නිලධාරීන්ට ලකුණු ලබාදෙනු ලැබේ.

03. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අවසන් පුරප්පාඩු කිහිපය සඳහා සමාන ලකුණු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව පුරප්පාඩු ප්‍රමාණයට වඩා වැඩිවන අවස්ථාවකදී සමාන ලකුණු ලැබූ නිලධාරීන්ගේ එවකට පවත්නා ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව සලකා උසස්වීම් ප්‍රදානය කරනු ලැබිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ජේ.බී.අයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/04-01-30/02/2018
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2019 ඔක්තෝබර් මස 25 දින

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 (I)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>ජ්‍යෙෂ්ඨතාවය සඳහා ලකුණු ලබාදෙනු ලබන යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකදී අනුගමනය කළයුතු ක්‍රියාපිළිවෙල.</u>

2019.06.13 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 ට සංශෝධන සිදු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

02. එම චක්‍රලේඛයෙහි ඇතුළත් වන "සේවා කාලය" යන්නෙන් "සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක්" අදහස් කෙරේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී.දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව